# පාලන වාර්තාව

# 2015

අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සබරගමුව පළාත් සභාව

# දැක්ම

“ විශ්ව දැනුමෙන් පරිපූර්ණ යහගුණ පිරි මානව සමාජයක් නිර්මාණය කිරීම”

# මෙහෙවර

“ සමසාධාරණ අධ්‍යාපන අවස්ථා සම්පාදනය පිණිස අධ්‍යාපන ආයතන මෙහෙයවීම, අනාගත අවශ්‍යතාවලට ගැලපෙන ලෙස තොරතුරු තාක්ෂණ ප්‍රවේශයන් පුළුල් කිරීම, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා පෝෂණය උදෙසා භෞතික හා මානව සම්පත් සඵලදායීව යෙදවීම.”

## සංවිධාන සටහන
## අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - සබරගමුව පළාත් සභාව.



කාර්ය මණ්ඩල ප්‍රමාණය - 2015

| අනු අංකය | තනතුර | අනුමත සංඛාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ලේකම් | 01 | 01 | |
| 2 | සහකාර ලේකම් | 02 | 02 | |
| 3 | සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන) | 01 | 01 | |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | 01 | 01 | |
| 5 | ගණකාධිකාරී | 01 | 01 | |
| 6 | පරිපාලන නිළධාරි | 01 | 01 | |
| 7 | සංස්කෘතික නිළධාරි | 10 | 09 | 01 |
| 8 | සංවර්ධන නිළධාරි | 60 | 40 | 20 |
| 9 | කළමනාකරණ සහකාර | 14 | 14 | - |
| 10 | රියදුරු | 4 | 04 | - |
| 11 | කාර්යාල සහයක | 4 | 04 | - |
| | **එකතුව** | **99** | **78** | **21** |

# අධ්‍යාපන,තොරතුරු, තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

විශ්ව දැනුමෙන් පරිපූර්ණ යහගුණ පිරි මානව සමාජයක් නිර්මාණය කිරීම දැක්ම කරගනිමින් එය සාක්ෂාත් කරගනු වස් සම සාධාරණ අධ්‍යාපන අවස්ථා සම්පාදනය පිණිස අධ්‍යාපන ආයතන මෙහෙය වමින්, අනාගත අවශ්‍යතා වලට ගැලපෙන ලෙස තොරතුරු තාක්ෂණ ප්‍රවේශයන් පුළුල් කිරීම සහ සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා පෝෂණය උදෙසා භෞතික හා මානව සම්පත් සඵලදායීව යෙදවීම තුලින් සබරගමුව ජනතාවගේ ජීවන මග සුරක්ෂිත සෞභාග්‍යමත් අනාගතයක් සඳහා වූ මෙහෙවරක් ඉටු කිරීමට අප පෙළ ගැසී සිටිමු.

පළාත් අතර භූමි විශාලත්වයෙන් සබරගමුව අටවැනි ස්ථානය ගන්නා අතර සබරගමුව පළාතේ අධ්‍යාපනය අද වන විට ජාතික මට්ටමේ ජයග්‍රහණ රාශියක් අත්කරගෙන ඇත. මෙම අමාත්‍යාංශය මගින්පළාත් අධ්‍යාපන කාර්යාලය ඇතුළු කලාප අධ්‍යාපන කාර්යාල 07 ක, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 27 ක හා පලාතේ පාසල් 1125 ක, ගුරු භවතුන් 24352ක් හා පාසල් සිසුන් 386516 ක ගේ සංවර්ධන කටයුතු හා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.

**<u>පළාතේ සාමාන්‍ය අධ්‍යාපනික තොරතුරු</u>**

| EDUCATION ZONE | SINHALA | | | TAMIL | | | GRAND TOTAL |
|---|---|---|---|---|---|---|---|
| | NATIONAL | PROVINCIAL | TOTAL | NATIONAL | PROVINCIAL | TOTAL | |
| BALANGODA | 1 | 107 | 108 | 1 | 22 | 23 | **131** |
| EMBILIPITIYA | 3 | 108 | 111 | | 15 | 15 | **126** |
| NIVITIGALA | 2 | 113 | 115 | | 30 | 30 | **145** |
| RATNAPURA | 7 | 147 | 154 | | 36 | 36 | **190** |
| DEHIOWITA | 4 | 162 | 166 | | 61 | 61 | **227** |
| KEGALLE | 6 | 139 | 145 | | 18 | 18 | **163** |
| MAWANELLA | 3 | 119 | 122 | 1 | 20 | 21 | **143** |
| **GRAND TOTAL** | **26** | **895** | **921** | **2** | **202** | **204** | **1125** |

මාධ්‍යය හා ජාතික/පළාත් සහා අනුව පාසල් සංඛ්‍යාව (වගුව 1)

| EDUCATION ZONE | 1AB | 1C | TYPE2 | TYPE3 | Grand Total |
|---|---|---|---|---|---|
| BALANGODA | 10 | 18 | 64 | 39 | **131** |
| EMBILIPITIYA | 15 | 15 | 55 | 41 | **126** |
| NIVITIGALA | 11 | 17 | 54 | 63 | **145** |
| RATNAPURA | 23 | 34 | 78 | 55 | **190** |
| DEHIOWITA | 16 | 29 | 89 | 93 | **227** |
| KEGALLE | 19 | 30 | 54 | 60 | **163** |
| MAWANELLA | 14 | 31 | 47 | 51 | **143** |
| Grand Total | **108** | **174** | **441** | **402** | **1125** |

වර්ගය අනුව පාසල් සංඛ්‍යාව (වගුව 2)

## අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංරචක

1. අධ්‍යාපන
2. සංස්කෘතික
3. තොරතුරු තාක්ෂණ

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ලෙස 2015 වර්ෂයේ දී සබරගමුව පළාතේ පාසල් රැසකට නව භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමටත්, තිබෙන පහසුකම් වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත. එහිදී අධ්‍යාපන සංවර්ධන, පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන, , ලෝක බැංකු සහ සංස්කෘතික කටයුතු යන අංශ යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

සංස්කෘතික සංරචකය යටතේ පළාතේ සමාජ සංස්කෘතික සංවර්ධනයක් ඇති කිරීම සහ සදාචාර සම්පන්න සමාජයක් බිහිකිරීමේ අරමුණින් සංස්කෘතික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ සියළු ආගම් ආවරණය වන පරිදි ආගමික සිද්ධස්ථානවල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කෙරේ. එයට අමතරව වාර්ෂිකව සංවිධානය කරන සාහිත්‍ය උත්සවය,දහම්පාසල් හා කලායතන සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ඇත. 2015 වසරේද සාහිත්‍ය උත්සවය,කලායතන තරඟ සාහිත්‍ය තරඟ හා දහම් පාසල්වලට උපකරණ ලබා දීම සාර්ථකව සිදු කරන ලදි. එමෙන්ම ආගමික සිද්ධස්ථානවල සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

තොරතුරු තාක්ෂණ යටතේ කුසලතා සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. පාසල්වල පරිගණක කාමර සකස් කිරීමට අවශ්‍ය භෞතික

සම්පත් සපයාදීම සිදුකරන ලදී. 2015 වර්ෂය වන විට වියිමත් පරිගණක විද්‍යාගාර 540 ක් ස්ථාපිත කර ඇත.

අධ්‍යාපන සංවර්ධනයේදී 2015 වර්ෂයේදී සබරගමුව පළාත් පාසල් රැසකට නව භෞතික පහසුකම් ලබා දීමටත්,තිබෙන පහසුකම් වැඩි දියුණු කිරිමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය. එමෙන්ම ගුරු සම්පත වඩා කාර්යක්ෂම හා ඵලදායි ලෙස බෙදා හැරීම,නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය,පරිගණක ඇතුළු භෞතික සම්පත් ලබා දීම සිදු කරන ලදි. එමෙන්ම වතු පාසල් සංවර්ධන වැඩසටහන හා ද්විතීක පාසල් සංවර්ධන වැඩසටහන යටතේ පළාතේ පාසල්වල භෞතික සම්පත් වැඩි දියුණු කිරීම තව දුරටත් සිදු කෙරුණි.

## අධ්‍යාපන සංවර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඒතුලින් අත්කරගනු ලැබූ ප්‍රගතිය

- අධ්‍යාපනය සඳහා වූ පහසු ප්‍රවේශය සැලසීම
- ගුරු භවතුන්ගේ වෘත්තිය කුසලතා සංවර්ධනය
- ග්‍රාමීය මට්ටමේ දරුවන් ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් පදිංචි ස්ථානයේ සිට කි.මී 2 ක් ඇතුලත ලබා ගත හැකි වන සේ ප්‍රාථමික පාසල් ජාලයක් නවිකරණය කිරිම
- සෑම ප්‍රාථමික පාසල් ජාලයකටම පහසුකම් වලින් සමන්විත එක් ද්වීතීයික පාසලක් සංවර්ධනය කිරිම
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන
- මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරිම
- පෝෂිත ප්‍රාථමික පාසල් සඳහා පාසල් පාදක ප්‍රතිපාදන ලබාදීම
- ද්වීභාෂා අධ්‍යාපනය නැංවිම
- කලාපිය හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ශක්තිමත් කිරිම
- ගුරු සම්පත වඩා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස බෙදා හැරිම
- නිළධාරින්ගේ ධාරිතා සංවර්ධනය
- පරිගණක ඇතුළු අනෙකුත් භෞතික සම්පත් ලබාදිම

- **2015 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් දිවයිනේ සිංහල මාධ්‍යයෙන් ප්‍රථම ස්ථානය දෙකක් බිහිවීම (කෑගල්ල හා මාවනැල්ල)**
- **2015 වර්ෂයේ සමස්ථ ලංකා පාසල් මලල ක්‍රීඩා තරගාවලියේ තෙවන ස්ථානයද, දක්ෂතම ක්‍රීඩකයා හා ක්‍රීඩිකාව සබරගමුව පළාතෙන් බිහිවීම ඇඹිලිපිටිය/කෑගල්ල**
- **2015 වර්ෂයේ සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ දක්ෂතම කරාතේ ක්‍රීඩිකාව, ක්‍රීඩකයා , දක්ෂතම වොලිබෝල් ක්‍රීඩිකාව හා දක්ෂතම ටයිකොන්ඩෝ ක්‍රීඩිකාව සබරගමුව පළාතෙන් බිහිවීම.**
- **සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගාවලියේ ප්‍රථම ස්ථාන 2 ක් ලැබීම**
- **සමස්ත ලංකා පාසල් සංගීත තරගයේ ප්‍රථම ස්ථාන 11 ක් ලැබීම**
- **සමස්ත ලංකා තරගාවලියේ සමස්ථ ලංකා පාසල් නර්තන හා මුද්‍රා නාට්‍ය තරගයේ ප්‍රථම ස්ථාන 31 ක් ලැබීම**

**පූර්ව ළමාවිය සංවර්ධනය**

- පූර්ව ළමාවිය අධිකාරිය පිහිටුවීම
- අධිකාරිය සඳහා කාර්යාලයක් සකස් කිරීම
- අධිකාරිය යටතේ පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාවලට අදාළ නිළධාරීන් පුහුණු කිරීම

අටළුගම මෙනේරිපිටිය අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම

- ගොඩනැගිලි අළුත්වැඩියාව (දේශන ශාලා හා නේවාසිකාගාර)
- අධ්‍යාපන පරිසර නිර්මාණය (වට පිටාව මානසික සුවදායි පරිසරයක් බවට පත්කිරීම
- නව දේශනශාලා හා නේවාසිකාගාර ඉදිකිරීම සඳහා කටයුතු කරගෙන යාම

# 2015 වසරේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

## 01. විෂයන් අනුව ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන්

### ගණිතය

ගණිත විෂය සංවර්ධනය සඳහා පස් අවුරුදු කාලය තුළ විශේෂ අවධානයක් යොමු කරන ලදී. මූලික ගණිත සංකල්ප සංවර්ධනයේ සිට උසස් පෙළ ගණිත අංශය දක්වා ගුරුවරුන් හා සිසුන් බලගැන්වීමේ වැඩසටහන් පාසල් පාදකව මෙන්ම කලාප, පළාත් මට්ටමින් ද ඉටු කරන ලදී. ප්‍රතිඵල ඉහළ දැමීමේ වැඩසටහන්, ප්‍රතිකාර්ය ඉගෙනුම් ක්‍රමවේද, ගණිත උපකරණ නිර්මාණය, විෂයට අදාළ මෘදුකාංග නිර්මාණය කිරීම, ප්‍රායෝගික කඳවුරු පැවැත්වීම, ඔලිම්පියාඩ් ශිෂ්‍යත්ව ප්‍රදානය ආදී විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පළාතේ ගණිත විෂය ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

### විද්‍යාව

ආංශික සංවර්ධන ප්‍රවේශය යටතේ ලෝක බැංකු ආධාර මගින් හඳුන්වා දුන් වේගවත් ඉගෙනුම් වැඩපිළිවෙල (ALC) යටතේ විද්‍යාව විෂය සංවර්ධනය සඳහා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ගුරු භවතුන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන
- විෂය නිර්දේශවල ප්‍රතිසංස්කරණ දැනුවත් කිරීම
- සිසුන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ කඳවුරු පැවැත්වීම
- ඔලිම්පියාඩ් තරග සඳහා කඳවුරු පැවැත්වීම
- ජාත්‍යන්තර තරග සඳහා සිසුන් සූදානම් කිරීම.

### සිංහල

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සංවර්ධනය සඳහා පාසල් හා කලාප මට්ටමින් විශේෂයෙන් දුෂ්කර හා පහසුකම් අඩු ප්‍රදේශවල දරුවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. සාක්ෂරතාවය ඉහළ නැංවීම, සවන් දීම, කථන කුසලතා, ලිඛිත කුසලතා, රසවින්දනය, නිර්මාණශීලීත්වය, වචන කෝෂය පිළිබඳ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම තුළින් කැපීපෙනෙන ප්‍රතිඵල අත්පත් කර ගැනීමට හැකි විය.

ආගම

විවිධ ආගම් අදහන සිසුන් එකම වැඩසටහනක සහයෝගයෙන් යුතුව අන්‍යාගම්වලට ගරු කරමින් කටයුතු කිරීම පිළිබඳව විශේෂ වැඩසටහන් පාසල් මෙන්ම කලාප මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. සාරධර්ම හා විනය සංවර්ධන වැඩසටහන්, පරිසර සංරක්ෂණ වැඩසටහන් හා සමාජ සත්කාරක වැඩසටහන් සඳහා ප්‍රායෝගිකව සිසුන් හා ගුරුවරුන් සම්බන්ධ වන වැඩසටහන් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.

තොරතුරු තාක්ෂණය

2014 වර්ෂය වන විට විධිමත් පරිගණක විද්‍යාගාර 540 ක් ස්ථාපිත කර ඇත. වේගවත් අධ්‍යාපන ක්‍රියාවලි යටතේ තොරතුරු තාක්ෂණ විෂය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කොට ඇත.

02. පාසල්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල සඳහා පරිගණක හා උපාංග ලබා දීම.
03. නැණසැස රූපවාහිනී වැඩසටහන නැරඹීම සඳහා පහසුකම් ලබා දීම.
04. වාර්ෂික පරිගණක අලුත්වැඩියා කිරීමේ ජාතික වැඩසටහන තුළින් පාසල්වල පරිගණක 500 කට අධික සංඛ්‍යාවක් අලුත්වැඩියා කිරීම.
05. පරිගණක දෘඩාංග හා ජාල විසඳුම් කණ්ඩායමේ දෙවන අදියර පාසල් තුළ ක්‍රියාත්මක කිරීම.

**ප්‍රාථමික පාසල් ජාලයක් සඳහා ද්විතීයික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන.**

1. පළාතේ පාසල් 113 ක් අංග සම්පූර්ණ ද්විතියික පාසලක් ලෙස සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.
2. මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 111ක් ඉදිකර අවසන් අතර ඉතිරි 2 හි ඉදිකිරීම් නිම වෙමින් පවතී.
3. පාසල් 21 ක උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කර ඇත.
4. උසස් පෙළ විද්‍යා අංශය සඳහා ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

## **" ළඟම පාසල හොඳම පාසල "** වැඩසටහන

මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට 2 බැගින් පාසල් 56 ක් සංවර්ධනය කිරීම 2015 වසරේ දී ආරම්භ විය.

## **" සනීපාරක්ෂාව පෙරට "** වැඩසටහන

පාසල් 1000 ව්‍යාපෘතියට අයත් සියලුම පාසල් හා සියලුම ජාතික පාසල් එකතුව පාසල් 123 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. සනීපාරක්ෂක පහසුකම් සඳහා එක් පාසලකට රු. මිලියන 2 බැගින් ලබා දී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කළමනාකරණය, පරිපාලනය, සැලසුම්කරණය හා මූල්‍යකරණය යන අංශවල සමබර සංවර්ධනයක් ඇති කිරීම පිණිසත්, ඒ තුළින් යහ පාලනය බල ගැන්වීම හා සේවා සැපයීම පිණිස 2015 වර්ෂය තුළ ක්‍රයාකාරකම් රැසක් ක්‍රියාත්මක කොට ඇත. පාසල් බල ගැන්වීම සඳහා පාසල් නගාසිටුවීමේ වැඩපිළිවෙල විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන් මෙන්ම සියලුම නිලධාරීන් සාර්ථක ලෙස දැනුවත් කර නිම කර තිබේ. කෙටි කාලීන දේශීය පාඨමාලා මෙන්ම දිගු කාලීන විදේශීය පාඨමාලා සඳහා ද අවස්ථා සලසා ඇත.

## <u>අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය</u>

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය යටතේ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් උසස් සාධන මට්ටම් කරා සිසුන් මෙහෙයවීමට විවිධ පියවර ගනු ලැබීය. ලෝක බැංකු ආධාර මගින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ තේමා 3 ක් යටතේ අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය පෙළ ගස්වා ඇත. තේමා යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් පස් අවුරුදු සැලැස්ම සකස් කර 2015 වර්ෂයට නියමිත කාර්යභාරය ඉටු කිරීමට පියවර ගෙන තිබේ.

තේමා 1: මූලික හා ද්විතියික අධ්‍යාපන අංශවලට ශිෂ්‍ය ප්‍රවේශය හා සහභාගීත්වය වැඩි දියුණු කිරීම

විශේෂ ක්ෂේත්‍ර
1. නිදහස් අධ්‍යාපනය සාක්ෂාත් කිරීම සඳහා පාසල් පැමිණීම වැඩිදියුණු කිරීම
2. ගුණාත්මක මූලික හා ද්විතියික අධ්‍යාපනයක් සඳහා සම අවස්ථා ලබා දීමට භූගෝල විද්‍යාත්මක සාධක මත පාසල් ජාලය විචාරවත් කිරීම
3. විශේෂ අධ්‍යාපනය බල ගැන්වීම
4. නොවිධිමත් අධ්‍යාපනය බල ගැන්වීම

තේමා 2: ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය

විශේෂ ක්ෂේත්‍ර
1. සාම අධ්‍යාපනය
2. විෂය මාලා සංවර්ධනය
3. ගුරු සංවර්ධනය
4. විභාග ප්‍රතිසංස්කරණ
5. පෙළපොත් සම්පාදනය හා බෙදාහැරීම

තේමා 3: අධ්‍යාපනයේ යහ පාලනය හා සේවා සැපයීම සවිමත් කිරීම

විශේෂ ක්ෂේත්‍ර
1. ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම
2. පර්යේෂණ හා සමීක්ෂණ
3. පාසල් පාදක කළමනාකරණය හා පාසල් නගාසිටුවීමේ වැඩසටහන
4. ධාරිතා සංවර්ධනය
5. මානව සම්පත් සංවර්ධන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම
6. අධ්‍යාපනයේ ගුණාත්මක බව මැනීම හා භෞතික සම්පත් සම්පාදනය

පදනම් අවස්ථාව:

විශේෂ ක්ෂේත්‍ර
1. අධ්‍යාපනයේ ආංශික සංවර්ධන සැලසුම සැකසීම
2. මධ්‍ය කාලීන අයවැය රාමුව සැකසීම

**2015 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය වෙනුවෙන් පහත පරිදි ප්‍රතිපාදන වෙන් කරන ලදී.**

| සංරචකය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදනය(රු.මි.) |
|---|---|
| ලෝක බැංකු ආධාර | 299.10 |
| අධ්‍යාපන සංවර්ධන (PSDG) | 226.00 |
| සංස්කෘතික කටයුතු | 5.00 |
| ප්‍රාග්ධන උපමාන පාදක ප්‍රදාන (CBG) | 10.00 |
| එකතුව | 540.10 |

**වියදම් වාර්තාව -2015 අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික අමාත්‍යාංශය**

| විස්තරය | පළාත්කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | පළාත් සභා උපමාන පාදක ප්‍රදාන | ලෝක බැංකු ප්‍රදාන |
|---|---|---|---|
| අධ්‍යාපනසංවර්ධන සැලැස්ම | 247,155,548 | 6,477,442 | |
| සංස්කෘතික කටයුතු | 14,577,670 | 1,993,007 | |
| පාසල් ප්‍රති නිර්මාණය කිරීමේ වැඩ සටහන | | | 295,112,463 |

**2015 වර්ෂයේ සමස්ත ආයෝජනය හා ප්‍රගතිය - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| ලැබුණු මුදල | වියදම |
|---|---|
| **178,069,716** | **168,464.841.69** |

# <u>අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ගනු ලැබූ විශේෂ ක්‍රියාමාර්ග</u>

1. ගුරු භවතුන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය.
2. ග්‍රාමීය මට්ටමේ දරුවන් ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් පදිංචි ස්ථානයේ සිට කි. මී. 2 ක් ඇතුලත ලබා /ගත හැකි වන සේ ප්‍රාථමික පාසල් ජාලයක් නවීකරණය කිරීම.
3. පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන.
4. මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදි කිරීම.

5.පෝෂිත ප්‍රාථමික පාසල් සඳහා පාසල් පාදක ප්‍රතිපාදන ලබාදීම.

6. ද්විභාෂා අධ්‍යාපනය නැංවීම.

7. කලාපීය හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ශක්තිමත් කිරීම.

08. ගුරු සම්පත වඩා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස බෙදා හැරීම.

09. නිදහස් අධ්‍යාපනය සාක්ෂාත් කිරීම සඳහා පාසල් පැමිණීම වැඩිදියුණු කිරීම.

10. විශේෂ අධ්‍යාපනය බල ගැන්වීම.

11. විෂය මාලා සංවර්ධනය,විභාග ප්‍රතිසංස්කරණ හා පෙළපොත් සම්පාදනය හා බෙදාහැරීම.

12. මානව සම්පත් සංවර්ධන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

13. අධ්‍යාපනය සඳහා වූ පහසු ප්‍රවේශය සැලසීම.

14. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.

15.ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පළාතේ පවතින අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන පහසුකම් සහිත ඒකක බවට පත් කිරීම

## 2015 වර්ෂයේ ළඟා කරගත් ඉලක්කයන්

2015 වර්ෂය වන විට ශිෂ්‍යත්ව ප්‍රතිඵල වර්ධනය

| Education Zone | 2010 % | 2011 % | 2012 % | 2013 % | 2014 % | 2015 % |
|---|---|---|---|---|---|---|
| Balangoda | 11.72 | 12.40 | 12.11 | 13.36 | 14.14 | 11.83 |
| Embilipitiya | 11.35 | 11.56 | 12.37 | 13.29 | 11.53 | 12.06 |
| Nivitigala | 8.25 | 7.72 | 8.88 | 9.38 | 9.12 | 8.65 |
| Ratnapura | 13.43 | 14.22 | 12.95 | 12.51 | 12.77 | 12.12 |
| Dehiowita | 7.75 | 8.46 | 8.34 | 7.57 | 8.40 | 9.10 |
| Kegalle | 13.49 | 12.95 | 14.07 | 13.46 | 14.34 | 12.23 |
| Mawanella | 11.10 | 11.78 | 12.22 | 10.52 | 11.31 | 8.70 |
| **Sabaragamuwa Province** | **11.67** | **11.56** | **12.07** | **11.55** | **11.84** | **10.64** |

5 ශිෂ්‍යත්වය සමත් වීමේ ප්‍රතිශතය 2010-2015

පසුගිය වර්ෂ 5 ක 5 ශිෂ්‍යත්ව ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් 2015 වර්ෂයේ ලකුණු 100 ට වැඩි සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිළිවෙල පාසල් හා කලාප මට්ටමින් සිදු කරන ලදී. සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මෙන්ම ගුරුවරුන් දැනුවත් කිරීම ද ඉතා පුළුල් අන්දමින් සිදු කරන ලදී.

**<u>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල</u>**

සාමාන්‍ය පෙළ ප්‍රතිඵල විශ්ලේෂණය තුළින් ඉතා පැහැදිළි දියුණුවක් පළාත තුළ දක්නට ලැබේ. පසුගිය පස් අවුරුදු සැලසුම් කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිඵල ඉහළ දැමීමේ විශේෂ වැඩසටහන් තුළින් පළාතක් ලෙස 8.86% කින් සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට සමත් වී ඇත. විශේෂත්වය වන්නේ 2013 හා 2014 වර්ෂවල දී සියලුම කලාප වේගවත් සංවර්ධනයක් අත්පත් කරගෙන තිබීමයි. පළාත් මට්ටමින් ද සබරගමුව පළාත 2015 දී 4 වන ස්ථානයලබාගෙන තිබේ.

| Education Zone | 2010 % | 2011 % | 2012 % | 2013 % | 2014% |
|---|---|---|---|---|---|
| Balangoda | 59.39 | 57.73 | 60.17 | 64.53 | 66.04 |
| Embilipitiya | 53.60 | 54.18 | 58.37 | 60.35 | 62.58 |
| Nivitigala | 51.29 | 52.57 | 58.29 | 64.69 | 65.11 |
| Ratnapura | 60.03 | 62.82 | 66.47 | 68.07 | 69.30 |
| Dehiowita | 56.47 | 58.61 | 63.02 | 63.48 | 66.04 |
| Kegalle | 68.11 | 70.01 | 72.76 | 74.33 | 75.62 |
| Mawanella | 62.21 | 61.15 | 64.32 | 66.30 | 68.73 |
| **Sabaragamuwa Province** | **59.40** | **60.44** | **64.30** | **66.60** | **68.26** |

අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල 2010-2014

## 03.අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල වර්ධනය - 2015

උසස් පෙළ ප්‍රතිඵල විශ්ලේෂණය තුළින් ද පස් වසරක ක්‍රමවත් ප්‍රගතියක් පළාත තුළ දක්නට ලැබේ. මෙයින් සුවිශේෂී වන්නේ 2015 වර්ෂයේ දී සබරගමුව පළාත මුලු දිවයිනෙන්ම දෙවනස්ථානය ලබා ගැනීමයි.

| Province | Total No. Sat | No. Passed in All 3 Subjects (Eligible for University entrance | |
|---|---|---|---|
| | | No. | % |
| Northern | 12684 | 8274 | 65.23 |
| Sabaragamuwa | 20451 | 13268 | 64.88 |
| Western | 56521 | 35516 | 62.84 |
| Uva | 14093 | 8852 | 62.81 |
| Southern | 29945 | 18668 | 62.34 |
| Eastern | 14658 | 9043 | 61.69 |
| Central | 26046 | 15967 | 61.30 |
| North Western | 24032 | 14455 | 60.15 |
| North Central | 11910 | 7094 | 59.56 |
| **All Island** | **210340** | **131137** | **62.35** |

අ.පො.ස. (උ.පෙළ) පළාත් මට්ටමේ ප්‍රතිඵල 2015

උසස් පෙළ කලා අංශයේ ප්‍රතිඵල නොකඩවා වර්ධනය වීමක් දක්නට ලැබේ. 2015 වර්ෂය තුළ පහසුකම් අඩු ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්වල දරුවන් සඳහා විශේෂ උපකාරක

සම්මන්ත්‍රණ හා වැඩසටහන් පැවැත්වීම තුළින් උසස් පෙළ අංශයේ ද කලා මෙන්ම වාණිජ අංශයේත් ප්‍රතිඵල ඉහළ මට්ටමක රඳවා ගැනීමට හැකි විය. ESDFP ව්‍යාපෘතිය යටතේ පාසල් මට්ටම දක්වා ප්‍රමාණවත් මුදල් සපයමින් සැලසුම්සහගත ක්‍රමවේදයක් තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය අත්පත් කර ගැනීමේ අරමුණ 2015 වර්ෂයේ ඉතා සාර්ථකව ඉටු වී ඇති බව ප්‍රතිඵල තුළින් පැහැදිලි වේ.

## 04.රඳී සිටීමේ ප්‍රතිශතය 2010 -2014

| No. Survived Through | 2010 % | 2011 % | 2012 % | 2013 % | 2014 % |
|---|---|---|---|---|---|
| 1-5 Grade Cycle | 99 | 98 | 98 | 99 | 99 |
| 1-9 Grade Cycle | 91 | 91 | 92 | 91 | 92 |
| 1-11 Grade Cycle | 84 | 84 | 84 | 84 | 85 |

2010 සිට 2014 දක්වා රඳී සිටීමේ අනුපාතයන් (වගුව 5)

## 05. ගුරු පුහුණුවේ වර්ධනය.

අලුතින් බඳවා ගනු ලැබූ උපාධිධාරීන්හා ගුරු සහායකවරුන් බඳවා ගැනීම තුළින් පළාතේ නුපුහුණු ගුරු සංඛ්‍යාව සකස් වී තිබේ. මේ අතරින් උපාධිධාරීන් 9882දෙනාගෙන් නුපුහුණු සංඛ්‍යාව 188 කි. මෙයින් 98% ක් පමණ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා හදාරමින් සිටී. ගුරු සහායක හා ස්වේච්ඡා ගුරුවරුන් මේ වන විට ආයතනික වෘත්තීය පුහුණුවලට යොමු වී ඇත. 2015 වර්ෂය තුළ නුපුහුණු ගුරු සංඛ්‍යාව පුහුණු කර ගැනීමේ කටයුතු ඉතා සාර්ථකව සිදු විය.

| EDUCATION ZONE | GRADUATE | TRAINED | UNTRAINED | TRAINEE | OTHER | **Grand Total** |
|---|---|---|---|---|---|---|
| BALANGODA | 1061 | 1514 | 19 | 82 | 3 | **2679** |
| EMBILIPITIYA | 1106 | 1925 | 5 | 1 | 9 | **3046** |
| NIVITIGALA | 859 | 1385 | 22 | 51 | | **2317** |
| RATNAPURA | 1931 | 2816 | 7 | 86 | | **4840** |
| DEHIOWITA | 1503 | 2060 | 86 | 78 | 18 | **3745** |
| KEGALLE | 1897 | 2190 | 26 | 42 | 2 | **4157** |
| MAWANELLA | 1779 | 1756 | 23 | 9 | 1 | **3568** |
| **Grand Total** | **10136** | **13646** | **188** | **349** | **33** | **24352** |

වර්ග අනුව ගුරු සංඛ්‍යාව

## 2011-2015 කාලය තුළ මුහුණ දුන් ගැටළු

අධ්‍යාපනයේ ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන අධ්‍යාපන ක්ෂේත්‍රයට අලුතින් එක් වූ සැලසුම්කරණ ක්‍රමවේද භාවිතා කරන ලද්දකි. මෙම ක්‍රමවේද තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය මෙන්ම විනය, සාරධර්ම හා ජාතික ඒකාග්‍රතාවය ඇතිවන පරිදි පාසල් අධ්‍යාපනය සැලසුම්සහගත ප්‍රවේශයකට මුහුණ පාන ලදී. මෙහිදී උද්ගත වූ ගැටලු රැසකි.

1. නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම ප්‍රජාව ද සම්ප්‍රදායානුකූල බවින් මිදී නව තාක්ෂණය භාවිතය පිළිබඳව මැලි කමක් දැක්වීම.
2. නව ප්‍රවේශයකට උචිත ආකල්ප සංවර්ධනයට අකමැති වීම.
3. දත්ත හා තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය.
4. දත්ත විශ්ලේෂණයට හා විශ්ලේෂිත දත්ත ඇසුරින් අනාගත පුරෝකථනයන් කිරීමට අදාළ පුද්ගලයන් තුළ දැනුම නොමැති වීම.
5. ප්‍රගති වාර්තාකරණයේ දුර්වලතාවය.
6. පාසල් මට්ටමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් ලබා දීමට නොහැකි වීම.

## ගැටළු මඟහරවා ගැනීමට කරනු ලබන යෝජනා

### යෝජනා

1. ආංශික ප්‍රවේශය හා එහි ඇති වාසි අවාසි පිළිබඳව පුළුල් මට්ටමින් සියලුම අංශ දැනුවත් කිරීම.
2. ඉහළ ගුණාත්මක සංවර්ධනයක් සඳහා විදුහල්පති හා ගුරු භූමිකා ආකල්ප සංවර්ධනය.

3. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතයට විද්‍යාත්මක ප්‍රවේශයන් හඳුන්වා දීම.
4. ඉලක්ක පිහිටුවා ගැනීම හා සපුරා ගැනීම අතර කාලය සැලසුම්සහගත වීම පිළිබඳ අවබෝධය ලබා දීම.
5. මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම.
6. භෞතික සම්පත් සම්පාදනයේ දී අත්‍යවශ්‍ය බව පිළිබඳ ප්‍රමුඛතාවය ලබා දීම.
7. නියාමනය හා ප්‍රතිපෝෂණය පිළිබඳ කාර්යක්ෂම ක්‍රමවේද භාවිතය අනිවාර්ය කිරීම.
8. නියාමනය හා ප්‍රතිපෝෂණය පිළිබඳ කාර්යක්ෂම ක්‍රමවේද භාවිතය අනිවාර්ය කිරීම.
9. දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීම.
10. සංවර්ධනය කරන ද්වීතියික පාසල් 1000 වැඩසටහනට සමගාමීව ප්‍රාථමික පංති පැවැත්වෙන පාසල්වල පහසුකම් දියුණු කිරීම සඳහා අමතර ප්‍රතිපාදන අවශ්‍යතාවය

## <u>මානව සම්පත් සංවර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග</u>

1. 2015 වර්ෂයේදී නව ගුරුවරුන් 1114 ක් සබරගමුව පළාත සඳහා බඳවා ගන්නා ලදී.

| කලාපය | ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| බලංගොඩ | 150 |
| ඇඹිලිපිටිය | 196 |
| නිවිතිගල | 183 |
| රත්නපුර | 252 |
| දෙහිඕවිට | 195 |
| කෑගල්ල | 63 |
| මාවනැල්ල | 75 |
| පළාත | 1114 |

2. විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
   - ගුරු භවතුන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන.
3. ප්‍රායෝගික පුහුණු කඳවුරු පැවැත්වීම.
4. ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ කලාප මට්ටමින් ප්‍රසම්පාදන පුහුණු වැඩමුළු පැවැත්වීම